# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2382/33 - 2024 මැයි මස 03 වැනි සිකුරාදා - 2024.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වන නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි ධාරිතාව පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව 2020 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 2202/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද නියමයට අමතර වශයෙන්, මෙම නියමය මගින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම් -

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2020 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 2202/3 දරන *ගැසට් නිවේදනයේ* දින සිට ලබා දී තිබූ වසර දෙකක (02) කාලය 2024 වර්ෂය අවසානය දක්වා (එනම්, 2024 දෙසැම්බර් 31 දක්වා) දීර්ඝ කිරීමේ අරමුණින්, 2020 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 2202/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ (1) වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) 2024 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළදී නිශේධන ලේඛනයේ (negative list) සඳහන් අයිතම හැර ධාරිතාව පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන සියලුම උපකරණ/ උපාංග/ කොටස් රේගු බදු ගෙවීමෙන් නිදහස් වන්නේය".

ධාරිතාව පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ආයෝජනය දැක්වීම පිණිස 2020 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 2202/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (2) වැනි වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් (3) වැනි වගන්තිය ඇතුළත් කරනු ලැබේ:

"(3) 2024 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ව්‍යාපෘති සමාගම අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන හැටක (ඇ.ඩො. 60,000,000) මුදලක්, නැතහොත් හුවමාරු කළ හැකි වෙනත් ඕනෑම මුදල් ඒකකයකින් එකී වටිනාකමට සමාන මුදලක් යෝජිත ධාරිතාව පුළුල් කිරීමේ ව්‍යාපෘතියෙහි ආයෝජනය කළ යුතු ය".

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0022

1A - PG 6712 - 324 (2024/05)     ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*